# වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව

# වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

## 2021 වර්ෂයේ / 42 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව

## 2021-09-09

**පැමිණීම**

1. ගරු සභාපති කේසුසන්ත පෙරේරා මහතා .වි.
2. ගරු උප සභාපති ආර් නිලංක සඳකැල් මහතා .ඒ.
3. ගරු මන්ත්‍රී ඒම මහතාකිත්සිරි අභයවික්‍ර .එම්.එස්.
4. ගරු මන්ත්‍රී ඩබ්නාන්දු මහතාජෝන් බැප්ටිස් ප්‍ර .
5. ගරු මන්ත්‍රී යුජුඩ් එම්මානුවෙල් මහතා .
6. ගරු මන්ත්‍රී කේනාන්දු මහතානාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍ර .
7. ගරු මන්ත්‍රී එම් .එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
8. ගරු මන්ත්‍රී එල්යංකර මහතාජගත් ප්‍රි. කේ.
9. ගරු මන්ත්‍රී ඩබ්නාන්දු මහතාලෙනාඩ් දීමස් ප්‍ර .
10. ගරු මන්ත්‍රී ඒනාන්දු මහතාභාත් ප්‍රරෙක්ෂි ප්‍ර .
11. ගරු මන්ත්‍රී කේචමින්ද කුමාර කරුණානායක මහතා .එල්.
12. ගරු මන්ත්‍රිනි ජී යන්ගිකාලීනා ප්‍රි .පෙරේරා මහත්මිය
13. ගරු මන්ත්‍රිනි ජේදීපා මේරි අයිරංගනි පෙරේරා මහත්මිය .කේ.
14. ගරු මන්ත්‍රී කේනොඑල් සුදත් ජානක පෙරේරා මහතා .
15. ගරු මන්ත්‍රිනි අයිලතා මහත්මියනයෝමි රමා .එච් .
16. ගරු මන්ත්‍රී ඩබ්නාන්දු මහතාඩ් ෂවින් ප්‍රරෙන්ප්‍රි .ඒ.
17. ගරු මන්ත්‍රී ආර්අකිල ශිරංග රාජපක .පි.ෂ මහතා
18. ගරු මන්ත්‍රී ඩීඅමල් සුරංග මහතා .එල්.
19. ගරු මන්ත්‍රී ජිනාන්දු මහතාඅශේන් විමුක්ති ප්‍ර .කේ.
20. ගරු මන්ත්‍රී එච්ක්ලීටස් පෝල් පෙරේරා මහතා .ඒ.
21. ගරු මන්ත්‍රී එම්යන්ත පෙරේරා මහතායාල් බ්‍රප්‍රි .
22. ගරු මන්ත්‍රී ඩිනිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා .
23. ගරු මන්ත්‍රී බි .ඒශාන්ත පෙරේරා මහතා .එස්.
24. ගරු මන්ත්‍රිනි ආර්නදීකා රණවිර මහත්මිය .පි.
25. ගරු මන්ත්‍රී විවර්ණරංග ගුණසේකර මහතා .ඒ.
26. ගරු මන්ත්‍රී ඩබ්මසිංහ මහතාගෝඨාභය වික්‍ර .ඒ.

27. ගරු මන්ත්‍රිනි ඒවමිලා දිල්රුක්ෂිකා මහත්මිය .එම්.
28. ගරු මන්ත්‍රී ටි ඇන්ටනි කුමාර් මහතා .ඩී.බී.
29. ගරු මන්ත්‍රී අයි.බී. සැම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා
30. ගරු මන්ත්‍රී එස්දර්ශන දිමුතු කුමාර සුබසිංහ මහතා .එම්.

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

## 01. 2021.08.12 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම

පසුගිය රැස්වීම් වාර්තාව සභා සම්මත කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී.

| |
|---|
| **තීරණ අංක 01**<br><br>2021.08.12 **වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.** |

ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ගියවර මහා සභාව සඳහා ප්‍රශ්න දෙකක් ඉදිරිපත් කල බවත්, ඒ සඳහා මෙම මහා සභාවේදී පිළිතුරු ඉදිරිපත් කරන්නේදැයිද විමසා සිටින ලදී.

අද දින එම ප්‍රශ්න සඳහා පිළිතුරු ඉදිරිපත් නොකරන බවත්, මේ දින වල පවතින covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් නිලධාරීන් සීමිත ප්‍රමාණයක් පමණක් සේවයට කැඳවන බවත්, අදාල පිළිතුරු සකස් කිරීමට අදාල නිළධාරීන්ටද covid-19 වැලදී ඇති බැවින් ඔවුන් සුව වී පැමිණි වහාම එම ප්‍රශ්න සඳහා පිළිතුරු ඉදිරිපත් කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගිය මස මහා සභාවේදී තමන් ඉදිරිපත් කල **" 2018/2019/2020 වර්ෂ වල සහ 2021 වර්ෂයේ ජූනි මස දක්වා වෙන්නප්පුව බල ප්‍රදේශයේ මාර්ග පද්ධතිය සංවර්ධන සඳහා වියදම් කල මුදල් ප්‍රමාණය කොට්ඨාස 25 වෙන් වෙන් වශයෙන් කොපමණද? " යන ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබා දී ඇති බවත්, එය ඉල්ලා ඇති පරිදි සකස් කලේ නම් එක් පිටුවකට ලබා දීමට හැකි බවත් පිටු විශාල සංඛ්‍යාවක් තිබෙන බවත්** ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී. මෙහිදී සම්පූර්ණ විස්තරයම තිබේ දැයිද නැතිනම් තෝරා එවා ඇතිදැයිද තවදුරටත් විමසා සිටින ලදී.

සියළුම තොරතුරු ලබා දී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

**01. නිවාඩු අනුමත කිරීම.**

(I). අදදින මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ සහ ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

- ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
- ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා
- ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා
- ගරු මන්ත්‍රී ඩබ් .ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී සී.පී .සරත් වික්‍රමරත්න මහතා
- ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී ඩබ් .සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රිනි එච්.එම් .සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය
- ගරු මන්ත්‍රිනි පී.එම් .ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය
- ගරු මන්ත්‍රිනි එම් .මේරි වාලට් කුරේ මහත්මිය
- ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි චමෝදරී ප්‍රනාන්දු මෙනවිය
- ගරු මන්ත්‍රී වී.කේ.එම් .අසන්ත කුලසේකර මහතා

**තීරණ අංක 02**

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අද්දින මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා වූ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

- ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
- ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා
- ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා
- ගරු මන්ත්‍රී ඩබ් .ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී සී.පී .සරත් වික්‍රමරත්න මහතා
- ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී ඩබ් .සුරේන් ඇන්ටන් ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රිනි එච්.එම් .සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය
- ගරු මන්ත්‍රිනි පී.එම් .ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය
- ගරු මන්ත්‍රිනි එම් .මේරි වාලට් කුරේ මහත්මිය
- ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි චමෝදරී ප්‍රනාන්දු මෙනවිය
- ගරු මන්ත්‍රී වී.කේ.එම් .අසන්ත කුලසේකර මහතා

(ii) කාරක සභා සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

එමෙන්ම හැකි සෑම විටම කාරක සභා සඳහා සහභාගී වීමට කටයුතු කරන ලෙසටද ගරු සභාපතිතුමා වැඩිදුරටත් දන්වා සිටින ලදී.

**තීරණ අංක 03**

2021අගෝස්තු මස 31 වන දින පැවැත් වූ **මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සඳහා සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

| **2021 අගෝස්තු මස 31 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව** | |
|---|---|
| අ/අ | නම |
| **1.** | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| **2.** | ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා |
| **3.** | ගරු මන්ත්‍රී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **4.** | ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| **5.** | ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා |
| **6.** | ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |

02. වයඹ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් අපහරණය කරන ලද කැබ් රථයක් අළුත්වැඩියා කර කොවිඩ්-19 වසංගතය මර්ධනය සඳහා එන්නත් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සේවය සඳහා ලබා දීමට අපට හැකි විය.මේ සඳහා සහයෝගය ලබා දුන් ගරු ආණ්ඩුකාරතුමා, කොමසාරිස්තුමා, ලේකම්තුමා ඇතුළු ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ගරු සභාපතිතුමා ස්තුතිය පුද කරන ලදී.

03. රට තුළ පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ "වයඹ අභිමානී" ගිලන් රථ සේවාව ක්‍රියාත්මක වන බව ඉතාමත් සතුටින් දැනුම් දෙන ලදී.අප සභාවේ විදුලි අංශයේ කටයුතු සිදු කල ඩීමෝ මෝටර් රථය මේ සඳහා ලබා දුන් බවත්, එම සේවාව තුළින් සතියක් තුළ රෝගීන් හැත්තෑවක් අසූවක් පමණ රෝහල් වලට ගෙන ගිය බවත් ප්‍රකාශ කරන ලදී. වෙන්නප්පුව බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එම වාහනයේ සේවය සඳහා උදේ කාලයේ රියදුරු ධාරක මහතාගේද, රාත්‍රී කාලයේ රියදුරු නලින් මහතාගේද සේවාව ඇගයිය යුතු බවත්, ස්තුතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම එම අංශයේ නිලධාරීතුමිය ඇතුළු ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ගරු සභාපතිතුමා ස්තුතිය පුද කරන ලදී.

04. ලබන මස පස් වන දින වන විට එන්නත්කරණය 90%ක්, 95%ක් පමණ අවසන් වන බවත්, ෆයිසර් එන්නතේ දෙවන මාත්‍රාවද මේ තුළ ක්‍රියාත්මක වන බවත්, එන්නත ලබා ගැනීමට නොපැමිණෙන පුද්ගලයින්ට බලෙන් එය ලබා දීමට නොහැකි වන බවත්, අනෙකුත් සියළුම දෙනාට ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී. ආසනයක් ලෙස අප ඉතාමත් සතුටු විය යුතු බවත්, මේ සඳහා නායකත්වය ලබාදෙන අතිගරු ජනාධිපතිතුමා, ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාටද, ගරු රාජ්‍ය අමාත්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිණියටද, ගරු රාජ්‍ය අමාත්‍ය චන්න ජයසුමන මැතිතුමාටද ස්තුතිය පුද කරන ලදී. මෙම කටයුතු සඳහා සහයෝගය ලබාදෙන සියළු මන්ත්‍රී මණ්ඩලයටද විශේෂයේ එන්නත්කරණයේදී පෞද්ගලික මිල මුදල් පවා වැය කොට එම කටයුතු සාර්ථකව කර ගැනීමට සහයෝගය ලබා දුන් බවත්, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම්තුමිය, සහ දංකොටුව ලේකම්තුමාටද වෙන්නප්පුව හා දංකොටුව ,සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී දෙපලටද මහජන සෞඛ්‍ය , සහකාර පොලිස් අධි ,පරීක්ෂකතුමන්ලාටදකාරීතුමා ඇතුළු එම ආයතන වල නිලධාරී සේවක මහත්මමහත්මීන් සියළුම දෙනාටදඅප සභාවේ ලේකම්මහතා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළුම , .දෙනාටද ගරු සභාපතිතුමා ස්තුතිය පුද කරන ලදී

05. බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම ගරු රාජ්‍ය අමාත්‍ය ශශීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමන් විසින් පසුගිය දිනක වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කාබනික පොහොර නිෂ්පාදන අංගනය නිරීක්ෂණය කිරීම සිදු විය. එහිදී කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය කාබනික ආහාර, එළවළු,පලතුරු, මිරිස්,ලූණු, අර්තාපල් වගා ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන්ද සාකච්ඡා කරන ලදී. නායකයෙකු වශයෙන් පළමුවෙන්ම ගරු රාජ්‍ය අමාත්‍ය ශශීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමන් පැමිණි බවත්, එතුමාගේ පැමිණීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ගරු සභාපතිතුමා ස්තුතිය පුද කරන ලදී.

06. ගරු මන්ත්‍රී එම්.පී.ඩී.උදේෂ් තරංග කරුණාරත්න මහතා සභික ධුරයෙන් ඉල්ලා අස් වී ඇති බවට පුත්තලම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී එන්.රේගන් මහතා විසින් පිටපතක් සභාවට එවා ඇති බව දැනුම් දෙන ලදී.

07. කණිෂ්ඨ ලෝක ශූරතා මලල ක්‍රීඩා තරඟාවලියට සහභාගී වන වැකඩ මහා විද්‍යාලයේ රවිඳු දිල්ශාන් බණ්ඩාර නම් ශිෂ්‍යායාට ගරු මහා සභාවේදීද තීරණය වූ පරිදි රු.15,000ක මූල්‍යමය ආධාරයක් ලබා දීමට හැකි වූ බව ද දැනුම් දෙන ලදී. සියළුම දෙනාට ඒ සඳහා ස්තූතිය පුද කරන ලදී.

08. දංකොටුව මූලික රෝහල අප බල ප්‍රදේශයට භාග්‍යයක් බවත්, ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ සහ ව්‍යාපාරික ප්‍රජාවගේ සහයෝගය ඇතිව ලුණුවිල රෝහල නවීකරණය කර කාන්තා රෝගීන් සඳහා වෙන් කර දීමට හැකි වූ බවත්, එමෙන්ම  දංකොටුව මූලික රෝහලේ කොවිඩ්-19 රෝගීන් සඳහා නව වාට්ටු සංකීර්ණයක් ජනතා අයිතියට පත් කිරීමට පසුගිය දිනක හැකි වූ බවත්  ඒ සඳහා සහයෝගය ලබාදුන් ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාටද, ගරු රාජ්‍ය අමාත්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිණියටද, අනෙකුත් සියළුම දෙනාටද ස්තූතිය පුද කරන ලදී.

09. කොවිඩ්-19 වසංගතය රට තුළ තිබියදී අප සභාවක් ලෙස,  බල ප්‍රදේශයක් ලෙස ජයග්‍රහණ ලබා ගත් බවත් මේ සියල්ලම නිවැරදි කලමනාකරණය තුළින් ලබා ගත් දේ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. බදු මුදල් එකතු කිරීම සම්පූර්ණයෙන්ම ඇණහිට ඇති බවත්, පොළවල් සියල්ලම දින නියමයකින් තොරව වැසීමට සිදු වූ බවත් අද වන විට මේ ආකාරයෙන් කටයුතු කරනුයේ කලමණාකාරීත්වය නිසා බවත් ප්‍රකාශ කරන ලදී. පොදු පහසුකම් කමිටුවේ ගරු සභාපතිතුමා ඇතුළු සියළුම සාමාජිකයින්ට ස්තූතිවන්ත වන බවත් විදුලි අංශය අද වන විට මාසයකට ලක්ෂ 05ක් වැනි මුදලක් වැය කරන තත්ත්වයට පත් වී ඇති බවත් ,විශේෂයෙන් කොට්ඨාස දෙකක් එක් දිනකට එක වාහනයක් මඟින් අළුත්වැඩියා කටයුතු කරන බවත්, බල්බද ඉතාමත් අඩුවෙන් වැය වන බවත් ප්‍රකාශ කරන ලදී. දිනකට බල්බ 100 පමණ වැය වූ බවත් අද වන විට බල්බ ඉතාමත් අඩු ප්‍රමාණයක් වැය කරමින් මෙම කටයුතු කරන බවත් ඉතිහාසයේ සුවිශේෂී අවස්ථාවක් බවත් ප්‍රකාශ කරන ලදී. මෙම කටයුතු සඳහා සහයෝගය ලබා දෙන ලෙසද වාහනය රස්තියාදු නොකර පසුදින සෑදීමට තිබෙන බල්බ පිළිබඳව සවස් වන විට කටයුතු සූදානම් කර තබන ලෙසද ඉල්ලා සිටින ලදී.

කාල සටහන නොඑවා තිබූ බවත්, මහා සභා වාර්තාව සමඟ  එය එවා තිබූ බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. මෙම විශය සම්බන්ධයෙන් කීපදෙනෙකුම සිටින බැවින් අදාල දිනට දුරකථන ඇමතුමක් හෝ ලබා දෙන්නේ නම් මෙම කටයුතු සාර්ථක කර ගත හැකි බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

පසුගිය ඉරිදා වන විට මහා සභා වාර්තා සමඟ එම කාල සටහන ලබා දුන් බවත්, දින කීපයක ප්‍රමාදයක් තිබූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මෙම කටයුතු නිවැරදිව කලමණාකරණය කර ගන්නා ලෙසද , විදුලි කණු අංක කර ඇති බැවින් අදාල කණු අංකය ලබා දුන්නේ නම් මෙම කටයුතු තවදුරටත් සාර්ථක කර ගැනීමට හැකි බවද ප්‍රකාශ කරන ලදී.

කණු අංක මැකී ඇති බවත්, පොස්ටර් ගසා ඇති බවත් ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කරන ලදී.

මෙම කණු අංක කිරීම තවමත් විධිමත්ව අවසන් නොවූ බවත්, තමන් මෙම කණුවල ටැග් එකක් එල්ලීමට ලේකම්මහතා සමඟ ද කතා කරගත් බවත්  පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභාවේ ගරු සභාපති යූ.ජුඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී. එසේත් නොමැතිව කුමක් කලත් දීර්ඝ කාලයක් යන විට කණු අංකය මැකී යන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.එමෙන්ම ගරු සභාපතිතුමා සඳහන් කල ආකාරයට  අගෝස්තු මස බල්බ 752ක් පමණක් භාවිතා කර ඇති බවත්, මේ සඳහා වොට් 05 සුවිච් 123ක්ද, වූ පින් හෝල්ඩර් 123ක්ද භාවිතා කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. වයර් මීටර් 1095ක් පමණක් භාවිතා කර ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

අගෝස්තු මස 24 වන දින වයර් මීටර් 700ක් භාවිතා කර ඇති බව ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

දීර්ඝ කාලයක සිට තිබෙන ඉල්ලීමක් මත සිරිගම්පල ප්‍රදේශයේ අළුත්වැඩියාවක් කල බව ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

ගිය මස විදුලි අළුත්වැඩියා සඳහා රු.503,370.75ක මුදලක් වැය වී ඇති බවත්, විදුලි අංශය ආරම්භ කල දින සිට අවම මුදලක් වැය වූ පළමු මාසය මෙය බවත් ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී. බල්බ එකසිය ගණන් වැය වූ මාසද, ලක්ෂ දොලහක් පමණද වැය වූ මාස තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. මේ වන විට කොට්ඨාස දෙකක් සඳහා බල්බ පහලොවක් විසි පහක් අතර ප්‍රමාණයක් වැය වන ලෙස කටයුතු කෙරීගෙන යන බවද ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන්ම LED බල්බය ලබා ගැනීමට අවශ්‍ය අවකාශය ලබා දීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට සහ ගරු සභාවට ස්තූති වන්ත වන බවත් ප්‍රකාශ කරන ලදි. මෙම මස 25 වන දින වන විට එම මාසික කාලසටහන යැවීමට ක්‍රමවේදයක්ද සකසා ගන්නා බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් කතා කල යුතු බවත්, මේ සම්බන්ධයෙන් කතා කිරීමේදී රජය විසින් සෞභාග්‍යයේ මංපෙත් වැඩසටහන් මේ වසර තුළ ගෙන ආ බවත් ලබන මාසය වන විට එම වැඩ කටයුතු අවසන් වන බවත්, එමෙන්ම ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා සහ පළාත් සභා ගරු මන්ත්‍රීවරුන් දෙපල නම් කල ලෙස කාපට් පාරවල් දහයේ ව්‍යාපෘතිය ද සිදු වූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මෙම මුදල් සියල්ල හරියාකාරව හැසිරවීමට හැකි වූයේ කලමනාකරණය නිසා බවත්, තමන්ට ලැබුණු උපදෙස් මත මුල සිටම ලේකම්මහතා දැනුවත් කල බවත් ,එමෙන්ම ලැබීමට තිබූ මුදල් සොයා ගිය බවත්, පසුගිය වර්ෂයන්ට අදාල උසාවි දඩ සහ මුද්දර ගාස්තු රුපියල් කෝටි පහමාරක මුදලක් ලැබුණු බවත්, විශේෂයෙන්ම එම කටයුතු සඳහා සහය වූ ගිණුම් අංශයේ සේවය කරන සංවර්ධන නිලධාරී රේණුකා මහත්මියට ස්තූතිවන්ත වන බවත් ප්‍රකාශ කරන ලදී. කොවිඩ්-19 වසංගතයත් සමඟ ස්ථාවර තැන්පත් මුදලින් කෝටි 2ක් ලබා ගැනීමට සිදු වූ බවත් නමුත් එම මුදල ආපිට තැන්පත් කරගැනීමට හැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී. සෞභාග්‍යයේ මංපෙත් වැඩසටහනේදී රෙඩිමික්ස් දමා බිල් කල විගස එම මුදලින් 50% ක මුදලක් දීමට හැකි බවත් ප්‍රකාශ කරන ලදී.බදු මුදල් අහිමි වී ගොස් ඇති අවස්ථාවක ආර්ථික පාඩු සිදුවීමට ඉඩ ලබා නොදී මේ සියල්ල නිසි ලෙස සිදු කිරීමට හැකි වූයේ කලමනාකරණය තුලින් බවත් මෙම අවස්ථාවේදී ලේකම් මහතා ඇතුළු සියළුම නිලධාරී මහත්මමහත්මීන්ටද සේවක මහත්මමහත්මීන්ටද ස්තූතිය පුද කරන ලදී. අතිකාල දීමනා සහ අනෙකුත් දීමනා අඩු කල බවත්, පසුගිය දිනවල කසල අංගණයට බොරළු කියුබ් හැත්තෑවක් අසූවක් නොමිලයේ ලැබුණ බවත් ප්‍රකාශ කරන ලදී. සැප්තැම්බර් මස 15 වන දින ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ ජන්ම දිනය බවත්, එතුමාට සුභ පතමින් වසම් වල කටවුට් එකක් ප්‍රදර්ශනය කල හැකි බවත් ,සැප්තැම්බර් 20 වන දින කිරිමැටියාන පන්සලේ රාජ්‍ය උත්සවයක් තිබෙන බවත්, එමෙන්ම එළඹෙන 21 වන දින ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ සහ ගරු රාජ්‍ය අමාත්‍ය රොශාන් රණසිංහ මැතිතුමාගේ සහභාගීත්වයෙන් LRC ඉඩමේ ඉදි කිරීමට යෝජිත කොම්පෝස්ට් අංගණයට මුල්ගල තැබීමට අපේක්ෂා කරන බවද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මිලියන 27ක මුදලක් රජයෙන් ලැබී ඇති බවත් මේ සියල්ල ඉටු කර ගැනීමට ලැබීම පිළිබඳව බල ප්‍රදේශයක් ලෙස සතුටු විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. කැපවීම් කල සියළුම දෙනාට ස්තූතිවන්ත විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ලේකම්මහතා මේ වසර අවසන් වන විට විශ්‍රාම යන බවත්, තමන් එතුමාව තවත් වසරක් අප සභාවේ තබා ගැනීමට ඉල්ලීමක් කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. එතුමා මෙම කොම්පෝස්ට් අංගණයේ කටයුතු එමෙන්ම සෞභාග්‍යයේ මංපෙත් වැඩසටහනේ වැඩ කටයුතු, එමෙන්ම පළාත් පාලන අමාත්‍යාංශය හරහා ධීවර ප්‍රජාවට කඩ සීයකින් යුත් මාළු මාකට් එකක් ස්ථාපිත කිරීමට යෝජනා කල බවත් ඒ සඳහා අවසර ලැබී ඇති බවත් මෙවැනි වැඩ කටයුතු රාශියක් ඇති බැවින්

එතුමාව වසරක කාලයක් තබා ගැනීමට අනුමත  කර යවනා බවත් පළාත් පාලන කොමසාරිස්තුමාගේ සහ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියෙන් ඉදිරි කටයුතු සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.

වෙනත් ලේකම්මහතෙකු පැමිණියහොත් මෙම කටයුතු කිරීමට නොහැකිදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී. ලේකම්මහතා වැදගත් විදියට විශ්‍රාම යායුතු බවත් ලේකම්මහතා සමඟ අමනාපකමකට මෙය නොඅසන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

වසරක කාලයක් පමණක් ඉල්ලා සිටිය හැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තවත් කෙනෙකුට අවස්ථාව ලබාදෙන ලෙසත්, ලේකම්මහතාට වැදගත් විදියට විශ්‍රාම යාමට ඉඩ ලබාදෙන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

රාජ්‍ය සේවයේදී ඉල්ලීමක් කිරීමට අවස්ථාවක් තිබෙන බව ගරු මන්ත්‍රී එල්.කේ .ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ලේකම්තුමා විශ්‍රාම යාමට සූදානම් බවත්, මෙය  තමන්ගේ ඉල්ලීමක් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මෙම සියළුම කටයුතු දිවා රාත්‍රී නොබලා මහන්සී වී ගත් උත්සාහයේ ප්‍රතිපලයන් බවත් එයට ගෞරවයක් වශයෙන් තමන් ඉල්ලීමක් කල බවත්, එයට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත පමණක් අවසරය ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

විධිමත් අයදුම්පත්‍රයක් තිබෙන බවත් ලේකම්තුමාට කොන්ත්‍රාත් පදනම මත තවත් වසරක් ඉල්ලීමට හැකි බවත්, එයට අවසරය ලබා දුනහොත් සිටීමට හැකි බවත් ගරු මන්ත්‍රීවරුන් අත්සන් කර යැවීම අවශ්‍ය නොවන බවත් ගරු මන්ත්‍රී එම් විශ්වනාත් මංචනායක මහතාජිනේන්ද්‍ර .එම්. ප්‍රකාශ කරන ලදී.

ලේකම්මහතා මේ සියල්ල කලමණාකරණය කර ගැනීමට විශාල වෙහෙසක් ගත් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ලබන වසරේදීත් කොවිඩ් -19 වසංගතයත් සමඟ මෙම කටයුතු සිදු කර ගැනීමට නොහැකි වුවහොත් තවත් වසරකට ඉල්ලීමක් කල නොහැකි බවත් ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය තමන්ගේ ඉල්ලීමක් බවත්, එම ඉල්ලීම තමන් ගරු මහා සභාවට යොමු කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ලේකම් මහතාට සේවා දිගුවක් ලබා දීම සඳහා  මහා සභාවේ එකඟතාවයක් අවශ්‍ය බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙ වන විට වාරියපොල ප්‍රාදේශීය සභාවේද සිටි ලේකම්මහතාට  එලෙස වසරක කාලයක් දීර්ඝ කොට ලබා දී ඇති බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය යෝජනාවක් ලෙස ගරු සභාවට ඉදිරිපත් නොකලේ මන්දැයි ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා විමසා සිටින ලදී. මෙය න්‍යාය පත්‍රයට පිටින් දමා වාචිකව පවසන බවත්, මෙය න්‍යාය පත්‍රයට දමා තිබුයේනම් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට  සාකච්ඡා කොට තීන්දුවක් ලබා දීමට හැකි වන බවත් ප්‍රකාශ කරන ලදී.

මෙය ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන යටතේ ඉදිරිපත් කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහිදි ගැටළුවක් නොවන බවත්, නමුත් මහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටින දෙයක් බැවින් නයාය පත්‍රයට ඇතුළත් කිරීමට තිබූ බවත් ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය අනුමත කර යවා ඇත්නම් එය පවසන ලෙස ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම අවස්ථාවේදී පළමුවෙන්ම ඒ පිළිබඳව කතා කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

වැදගත් කාරණාවක් විශේෂ නිවේදන යටතේ නොදක්වන ලෙසද, ලිඛිතව දැක්වුයේනම් මන්ත්‍රී කණ්ඩායමක් ලෙස සාකච්ඡා කොට පැමිණෙන බවද  ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී. මේ සඳහා ගරු මහා සභාවේ අනුමැතියක් ලැබුණේදැයිද විමසා සිටින ලදී.

එ් සම්බන්ධව මෙම මොහොතේ කතා කල බවත්, කොමසාරිස්තුමාගේ හා ගරු ආණ්ඩුකාරතුමාගේ අභිමතය පරිදි කටයුතු කිරීමට සූදානම් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙය නැවතත් ඊළඟ මහා සභාවට යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන ලෙසට ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය නැවතත් යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන ලෙසද, සාකච්ඡා කොට තීරණයක් ගනිමුයැයිද ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

ලේකම්මහතා මෙම ස්ථානයේ සිටියදී කතා කිරිම සාදාචාරාත්මක නොවන බවත්, ඊළඟ මහා සභාවට මෙය යොමු කරන ලෙසද ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය පසුවට සාකච්ඡා කරමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

10. ප්‍රිමික්ස් අංශය විසින් පසුගිය දිනවල පහත නම් සඳහන් මාර්ග ප්‍රිමික්ස් කල බව දැනුම්දෙමි. ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

- කටුකෙන්ද පන්සල අසල පාර ප්‍රිමික්ස් කිරීම
- දික්වෙල මැද ගොඩැල්ල පාර පළුදු මකා ප්‍රතිසංස්කරණය කිරීම
- දංකොටුව වටරවුම් පාර පළුදු මකා ප්‍රතිසංස්කරණය කිරීම
- කිරිමැටියාන ඉද්දමල්පුර පාර පළුදු මකා ප්‍රතිසංස්කරණය කිරීම
- බෝතලේගම අතුරු මාර්ග පළුදු මකා ප්‍රතිසංස්කරණය කිරීම
- මීරිසන්කොටුව අතුරු මාර්ග පළුදු මකා ප්‍රතිසංස්කරණය කිරීම
- ගොඩැල්ල පල්ලිය මාර්ගය පළුදු මකා ප්‍රතිසංස්කරණය කිරීම
- කිරාගාර නිලපියස පළුදු මකා ප්‍රතිසංස්කරණය කිරීම
- හාල්දඬුවන දේවාලය අසල පාර පළුදු මකා ප්‍රතිසංස්කරණය කිරීම
- හාල්දඬුවන ගොවිජන සේවා මධ්‍යස්ථානය අසල පාර පළුදු මකා ප්‍රතිසංස්කරණය කිරීම
- වෙන්නප්පුව ගොරකගස් හංදිය පාර පළුදු මකා ප්‍රතිසංස්කරණය කිරීම
- ලිහිරියාගම පොල පාර පළුදු මකා ප්‍රතිසංස්කරණය කිරීම
- වෙන්නප්පුව සුගත් තිසේරා පාර පළුදු මකා ප්‍රතිසංස්කරණය කිරීම

11. 2022 වර්ෂය සඳහා අයවැය යෝජනා ඔක්තෝම්බර් මාසය වන විට ලබා දී අවසන් කරන ලෙසද ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී. විශේෂයෙන්ම මාර්ග ගැන නොහිතා කාණු සහ ඇළ මාර්ග ගැන සැලකිල්ලට ගෙන කටයුතු කරන ලෙසද ඉල්ලා සිටින ලදී. සෞභාග්‍යයේ මංපෙත් වැඩසටහන

අවසන් වීමේදී බල ප්‍රදේශයේ මාර්ග බොහෝමයක් සාදා අවසන් වන බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

12. ගරු මන්ත්‍රී ඩී .නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතාගේ විදේශ නිවාඩු අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

| තීරණ අංක 04 |
| --- |
| ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා විසින් 2021 ඔක්තෝම්බර් මස 10 වන දින සිට 2021 දෙසැම්බර් 15 වන දින දක්වා වෛද්‍යාධාර ලබා ගැනීම පිණිස විදේශ ගත වන බැවින් ඒ සඳහා විදේශ නිවාඩු ලබා දෙන ලෙසට යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී |

13. පසුගිය දිනවල වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව මඟින් සිදු කල සියළුම වැඩ කටයුතු ඩිජිටල් තිරය ඔස්සේ සියළුම ගරු මන්ත්‍රීවරුන්ට සහ ගරු මන්ත්‍රීවරියන්ට දැක ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.
14. සභාවෙන් වැටුප් ගෙවන දෛනික සහ කොන්ත්‍රාත් පදනම මත සිටින සේවක මහත්මමහත්මීන්ගේ තොරතුරු සභාගත කරන බව ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

## 03. යථා පරිදි කල් දී ඇති යෝජනා

### a. ගරු සභාපතිතුමාගේ යෝජනා

i. 2021-09- 06 වන දින පැවති මුදල් කමිටුවේදී අනුමත කරන ලද 2022 වර්ෂය සඳහා බදු හා ගාස්තු පැනවීමට අදාල නිවේදනය ගැසට් මඟින් ප්‍රසිද්ධ කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම පිණිස ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

| තීරණ අංක 05 |
| --- |
| 2021 වර්ෂයේ බදු හා ගාස්තු වෙනස් කිරීමක් නොකොට එම ගාස්තුව 2022 වර්ෂය සඳහා බදු හා ගාස්තු පැනවීමේ නිවේදනය ගැසට් මඟින් ප්‍රසිද්ධ කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී. |

ii. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ වර්ෂය 2022ට අදාලව සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

මෙහි යම් මුදල් ප්‍රමාණයක් සංශෝධනය කර තිබෙන බවද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| තීරණ අංක 06 |
| --- |
| |

2022 වර්ෂය සඳහා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව වෙත සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ජොන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

iii. සභාවට අයත් ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේ මාසික විදුලි බිල රුපියල් ලක්ෂ එකහමාරක් පමණ වන බැවින් මෙම විදුලි බිල පාලනය සඳහා සූර්ය පැනල් සවි කිරීම සුදුසු බවටත් ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කර කමිටුවක් පත්කර එය ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.
මේ සඳහා green solar (pvt) ltd – 43/B, වලව්වත්තදංකොටුව ලිපිනයේ සඳහන් ආයතනය විසින් , ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කර තිබෙන බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

කමිටු වාර්තාවක් මහා සභාවට ඉදිරිපත් කරමුයැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදි.

මේ සඳහා කමිටුවක් පත් කර ගන්නා ලෙස පරිසර හා මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභාවේ ගරු සභාපතිතුමා වන ගරු මන්ත්‍රී ඩබ්නාන්දු මහතාජෝන් බැප්ටිස් ප්‍ර .ට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සඳහා මිල ගණන් කැඳවීමක් සිදු කරන ලෙස ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ප්‍රධාන කාර්යාල භූමිය, දංකොටුව නගර ශාලා භූමිය, සතිපොළ ස්ථානද මේ සඳහා යොදවා ගත හැකි බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී නිර්ණායක තිබෙන බවත්, ඒ සම්බන්ධයෙන් කතා කර මිල ගණන් කැඳවීමක් සිදු කල යුතු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඉදිරිපත් කල යෝජනාවේ ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණය සඳහන් වන බවත්, ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාද වෙනත් ආයතන මගින්ද මිල ගණන් කැඳවීම සුදුසු බව යෝජනා කල බවත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී. මෙහිදී green solar (pvt) ltd – 43/B, වලව්වත්ත, දංකොටුව ලෙස සඳහන් ආයතනට පමණක් අනුමැතිය ලබා නොදී මිල ගණන් කැඳවා සුදුසු ආයතන තෝරා ගැනීම යෝග්‍යය බවද ප්‍රකාශ කරන ලදි.

මේ සඳහා පස් දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත් කරන ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම ව්‍යාපෘතිය අනුමත කරමුයැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදි.

ව්‍යාපෘතිය අනුමත කරමුයැයිද ඉදිරි වැඩ කටයුතු කමිටුව මඟින් සිදු කරමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

තීරණ අංක 07

සභාවට අයත් ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේ විදුලි බිල පාලනය සඳහාසූර්ය පැනල සවි කිරීම සුදුසු බවත්, ඒ සඳහා පරිසර හා මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභාවේ ගරු සභාපතිතුමා ප්‍රමුඛ සාමාජිකයින් පස් දෙනෙකුගෙන් යුත් කමිටුවක් පිහිටුවා ඒ පිළිබඳ සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

iv. වාර්ෂික බදු පදනම මත බදු දීමට අදාල සභා දේපල වර්ෂය සඳහා බදු දීමේදී පුවත් පත් දැන්වීම් 2022 -එහෙත් මේ වන විට පවතින කොවිඩ් .සිද්ධ කර මිල ගණන් කැඳවීම සිදු කල යුතුයමඟින් ප්‍ර19 වසංගත තත්වය හේතුවෙන් මෙම බදු දේපල විධිමත් පරිදි ක්‍රියාත්මක නොවන තත්ත්වයක් උද්ගත වී ඇති හෙයින්දපුවත්පත් දැන්වීම් සඳහා විශාල ම ,ුදලක් වැය වන බැවින්දපසුගිය වර්ෂ වලදී බදු දේපල ලබා , මේ සඳහා පුවත්පත් දැන්වීම් දැමීමෙන් ,පාරිකයින් පමණක් බැවින්දදේශයේ ව්‍යාගෙන ඇත්තේ ප්‍ර වර්ෂය සඳහා සභා දේපල බදු දීම සඳහා ගරු මහා 2022 දේශීය මට්ටමින් මිල ගණන් කැඳවාතොරව ප්‍රා සභාවේ අනුමැතිය ලබා ගැනීම පිණිස ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

තීරණ අංක 08

සභාවේ වාර්ෂික බදු පදනම මත බදු දීමට අදාල සභා දේපල වර්ෂය සඳහා බදු දීමේදී පුවත් පත් 2022 -එහෙත් මේ වන විට පවතින කොවිඩ් .සිද්ධ කර මිල ගණන් කැඳවීම සිදු කල යුතුයදැන්වීම් මඟින් ප්‍ර 19 වසංගත තත්වය හේතුවෙන් මෙම බදු දේපල විධිමත් පරිදි ක්‍රියාත්මක ක්‍රියාත්මක නොවන තත්ත්වයක් උද්ගත වී ඇති හෙයින්ද, පුවත්පත් දැන්වීම් සඳහා විශාල මුදලක් වැය වන බැවින්ද, පසුගිය වර්ෂ වලදී බදු දේපල ලබා ගෙන ඇත්තේ ප්‍රදේශයේ ව්‍යාපාරිකයින් පමණක් බැවින්ද, මේ සඳහා පුවත්පත් දැන්වීම් දැමීමෙන් තොරව ප්‍රාදේශීය මට්ටමින් මිල ගණන් කැඳවා වර්ෂය 2022 සඳහා සභා දේපල බදු දීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාවගරු මන්ත්‍රී ඒ් අනුව ඒ සඳහා මහා සභාවේ .ම මහතා විසින් ස්ථිර කරන ලදීකිත්සිරි අභයවික්‍ර.එම්.එස්. ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

## b. ගරු මන්ත්‍රී යෝජනා

i. වර්ෂයේ අයවැය යෝජනා යටතේ මොහොට්ටිමුල්ල කොට්ඨාසයෙන් ඉදිරිපත් කර ඇති යෝජනා 2021 නාමල් අනුරුද්ධ . කේයාත්මක කිරීම සඳහා ගරු මන්ත්‍රීසංශෝධනය කර පහත සඳහන් යෝජනා ක්‍රි නාන්දු මහතා විසින් ඉසිරිවර්ධන ප්‍රදිරිපත් කර ඇති ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

- ප/මොහොට්ටිමුල්ල දොස්තරවත්ත අතුරු මාර්ගය තාර දැමීම - රු.500,000.00
- උ/ඇටියාවල මීගහවෙල 2වන පටුමඟ අවසානයේ කොන්ක්‍රීට් මාර්ග කොටස සිට ප්‍රධාන පාර දෙසට කොන්ක්‍රීට් කිරීම - රු.600,000.00
- ප/දුම්මලකොටුව කටාන වත්ත පළමු පටුමඟ (චතුර පෙරේරා පදිංචි ) කොන්ක්‍රීට් කිරීම - රු. 500,000.00

තීරණ අංක 09

2021 වර්ෂයේ අයවැය යෝජනා යටතේ මොහොට්ටිමුල්ල කොට්ඨාසයෙන් ඉදිරිපත් කර ඇති යෝජනා සංශෝධනය කර පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

- ප/මොහොට්ටිමුල්ල දොස්තරවත්ත අතුරු මාර්ගය තාර දැමීම - රු.500,000.00
- උ/ඇටියාවල මීගහවෙල 2වන පටුමඟ අවසානයේ කොන්ක්‍රීට් මාර්ග කොටස සිට ප්‍රධාන පාර දෙසට කොන්ක්‍රීට් කිරීම - රු.600,000.00
- ප/දුම්මලකොටුව කටාන වත්ත පළමු පටුමඟ (චතුර පෙරේරා පදිංචි ) කොන්ක්‍රීට් කිරීම - රු. 500,000.00

ii. නයිනමඩම ඩිස්පෙන්සිරිය මාවත සිට ගලයාය පල්ලිය අසලින් යන මාර්ගය එම දේවස්ථානයට අනුබද්ධව " ජපමාල දේවමාතා පාර " ලෙසත්, එම මාර්ගය තල්දෙක දෙසට ගමන් කරන මාර්ගය සඳහා එම ප්‍රදේශය තුළ ජීවත් වූ කලා ශිල්පිණියක් වන ශ්‍රීමති රසාදරී මහත්මිය සිහිපත් කිරීම සඳහා එම මාර්ගය "ශ්‍රීමති රසාදරී මාවත " ලෙසත් නම් කර දෙන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ශවීන් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

තීරණ අංක 10/I

මැ/නයිනමඩම ඩිස්පෙන්සිරිය මාවත සිට ගලයාය පල්ලිය අසලින් යන මාර්ගය එම දේවස්ථානයට අනුබද්ධව " ජපමාල දේවමාතා පාර " ලෙස කර දෙන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ශවීන් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

- මාර්ගයේ නම- ජපමාල දේවමාතා පාර
- මාර්ගයේ දිග-මීටර් 447
- මාර්ගයේ පළල -මීටර් 07
- ආරම්භක ස්ථානය- ඩිස්පැන්සරිය පාර
- අවසන් ස්ථානය-රුක්අත්තනගහ පාර
- ග්‍රාම සේවා වසම නයිනමඩම/මැ -

තීරණ අංක 10/II

මැ/නයිනමඩම ජපමාල දේවමාතා පාරින් ආරම්භ වී තල්දෙක දෙසට ගමන් කරන මාර්ගය සඳහා එම ප්‍රදේශය තුළ ජීවත් වූ කලා ශිල්පිණියක් වන ශ්‍රීමති රසාදරී මහත්මිය සිහිපත් කිරීම සඳහා එම මාර්ගය "ශ්‍රීමති රසාදරී මාවත " ලෙස නම් කර දෙන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ශවීන් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

- මාර්ගයේ නම- ශ්‍රීමති රසාදරී මාවත
- මාර්ගයේ දිග-මීටර් 327
- මාර්ගයේ පළල -මීටර් 03
- ආරම්භක ස්ථානය- ජපමාල දේවමාතා පාර
- අවසන් ස්ථානය-තල්දෙක පාර
- ග්රාම සේවා වසම නයිනමඩම/මැ -

## 04. කාරක සභා වාර්තා සලකා බැලීම.

i. 2021-08-31 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සලකා බැලීම

තීරණ අංක 11

2021-08-31 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

## 05. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.

i. 2021 ජූනි මස වීථි පහන් නඩත්තු කිරීම පිළිබඳ ප්‍රගති වාර්තාව

**මෙම වාර්තාව මහා සභාව විසින් සලකා බලන ලදී.**

ii. 2021 ජූනි මස ඉන්ධන හා අලුත්වැඩියා වෙනුවෙන් වියදම් වූ වාර්තාව

**මෙම වාර්තාව මහා සභාව විසින් සලකා බලන ලදී.**

iii. ගරු මහා සභාවට ඉදිරිපත් කර අනුමත කල 2021 අප්‍රියෙල් මස ප්‍රාස 14 (ගෙවීම් වාර්තාව) මුද්‍රණ දෝෂයක් සිදු වී ඇති බව අනාවරණය වී ඇති බැවින් 2021 අප්‍රියෙල්, මැයි සහ ජූනි මාස වලට අදාලව ඉදිරිපත් කර ඇති සංශෝධන වාර්තා සඳහා ගරු මහා සභා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

- ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒම මහතාගේ යෝජනා කිත්සිරි අභයවික්‍ර.එම්.එස්. ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට .තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබුණි

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව පවතින කොවිඩ් - 19 තත්ත්වය හමුවේ කාර්යාල සඳහා සීමිත පිරිසක් පමණක් ගෙන්වා ගන්නා බැවින් 2021 ජූලි මස ප්‍රාස වාර්තා සකසා ගැනීමට නොහැකි වූ බව ප්‍රකාශ කරන ලදී. අප්‍රියෙල් මස වැටුප් සහ දීමනා යටතේ එක්කෝටි ලෙස සඳහන් විය යුතු මුදල හත්කෝටි ලෙස සඳහන් වී තිබූ බවත් එබැවින් එම ගණනය කිරීම තුළ එකතුව ඉදිරි මාසවලද පැමිණ ඇති බවත් එය සංශෝධනය කල බවත් ප්‍රකාශ කරන ලදී. එම සංශෝධිත වාර්තා ගරු මන්ත්‍රීමණ්ඩලය වෙත ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව ලබන ජූලි මස සිට නිවැරදි වාර්තා ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී. ඉදිරියේදී මෙම වාර්තා අභ්‍යන්තර විගණන නිලධාරීද පරීක්ෂා කර බලා ලබාදෙන බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ශේෂ පියවුම් වල වෙනසක් තිබෙන්නේදැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විමසා සිටින ලදී.

මෙහිදී වාර්තාවේ පමණක් වෙනසක් සිදු වී ඇති බවත්, මූල්‍යමය වශයෙන් වෙනසක් සිදු වී නොමැති බව ද ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණඅංක 12

ගරු මහා සභාවට ඉදිරිපත් කර අනුමත කල 2021 අප්‍රියෙල් මස ප්‍රාස 14 (ගෙවීම් වාර්තාව) මුද්‍රණ දෝෂයක් සිදු වී ඇති බව අනාවරණය වී ඇති බැවින් 2021 අප්‍රියෙල්, මැයි සහ ජූනි මාස වලට අදාලව ඉදිරිපත් කර ඇති සංශෝධන වාර්තා සඳහා ගරු මහා සභා අනුමැතිය ලබා දිම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

06. <u>වෙනත් කරුණු ඉදිරිපත් කිරීම</u> .

**i.** **ප්‍රාදේශීය සභාව සඳහා අවශ්‍ය ගොඩනැඟිලි ද්‍රව්‍යය හා මාර්ග සංවර්ධනය වන වැලි,බොරළු ,ABC චිප්ස්ගල් යනාදිය,ගබඩා කිරීම සඳහා ගබඩාවක් ආරම්භ කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා එම යෝජනාව ගරු සභාපතිතුමා ගරු සභාවට යොමු කරන ලදි.**

මෙය කර්මාන්ත කමිටුවෙන් සාකච්ඡා කල යෝජනාවක් බවත්, දැනටත් ද්‍රව්‍යය ලැබුණු පසුව තාක්ෂණ නිලධාරී ගොස් මිනුම්ගෙන ඒවා භාවිතයට යොදවා ගන්නා බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

බොරළු ලබා ගැනීම සම්බන්ධයෙන් ගැටළු තිබෙන බවත්, සභාවට බොරළු සහිත ඉඩමක් මිල දී ගෙන හෝ බදු ගෙන හෝ අවශ්‍ය බොරළු ලබා ගැනීමෙන් පසුව ඉදිරි ක්‍රමවේදයකට යමුයැයි සාකච්ඡා කල බව ගරු මන්ත්‍රී එම් විශ්වනාත් මංචනායක මහතාජිනේන්ද්‍ර .එම්. ප්‍රකාශ කරන ලදී. නොමිලයේ දිගටම නොලැබෙන බවත්, ඒවා දිගටම ලැබෙන්නේ නම් හොඳ බවත් ප්‍රකාශ කරන ලදී.

කසල අංගණයට බොරළු ලැබෙනුයේ කියුබ් 01 රුපියල් 700.00 බැගින් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. කියුබ් 1000 පමණ ලබා ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

ඉඩමක් සොයා ගැනීම ඉක්මනින් සිදු නොවන බවත් මෙය ස්ථිර කරගෙන තබා ගනිමුයැයිද ගරු මන්ත්‍රී එම් විශ්වනාත් මංචනායක මහතාජිනේන්ද්‍ර .එම්. ප්‍රකාශ කරන ලදී.

රු.700.00 බොරළු ලැබීම ස්ථිර නොවන බවත්, මෙය සම්මත කර ගෙන තබා ගනිමුයැයිද ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තුලාවල ප්‍රදේශයේ ඉඩම ලබා ගැනීමට යාමේදී එතැනද යම් බොරළු ප්‍රමාණයක් තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

**ABC සහ වැලි යම් ප්‍රමාණයක් සභාවේ තබා ගැනීම සුදුසු බවට කර්මාන්ත කමිටුවෙන් යෝජනා කල බවත්, ABC මිල ක්ෂණිකව වැඩි වූ බවත්, පාරවල් සෑදීමේදී ABC ලබා දීමට නොහැකි වූ බවත්, අප විසින් කුඩා පාරවල් සාදන බැවින් සභාවේ ABC සංචිතයක් තිබුයේනම් එම අවස්ථාවලට යොදා ගත හැකි බවත්** ගරු මන්ත්‍රී එම් විශ්වනාත් මංචනායක මහතාජිනේන්ද්‍ර .එම්. ප්‍රකාශ කරන ලදී. මෙය මැන සභාවේ ඉඩමක තැබිය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

ii. **පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අබලන් වූ ගිලන් රථ තිබේනම් ඒවා ගෙන අළුත්වැඩියා කර වෙන්නප්පුව ප්‍රධාන කාර්යාලයේ සහ දංකොටුව උප කාර්යාලයේ මහජන සේවය වෙනුවෙන් වෙන් කර තබමුයැයි** ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා යෝජනා කරන ලදී.

iii. එමෙන්ම සෙන්දිරියාමුල්ල ඉදි කිරීමට යෝජිත කොම්පෝස්ට් අංගණයේ ගොඩනැඟිලි ඉදි කිරීම සම්බන්ධයෙන් මේ වන තෙක් කිසිදු ආකෘතියක් ලබා නොදුන් බවත්, මේ සම්බන්ධයෙන් තමන් වැඩ අධිකාරී මහතාගෙන් ඉල්ලූ බවත් කිසිඳු දෙයක් මේ සම්බන්ධයෙන් තමන් නොදන්නා බවත් එම කමිටුවේ සභාපතිවරයා තමන් බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු ප්‍රකාශ කරන ලදී.

මීට වසර දෙකකට පෙර සිට දංකොටුව ජල පවිත්‍රාගාරය ඉදි කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කල බවත්, නමුත් මේ වන තෙක් සිදු නොවූ බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු ප්‍රකාශ කරන ලදී. කඩිනමින් කොම්පෝස්ට් අංගණයේ ගොඩනැඟිලි ඉදි කිරීම සම්බන්ධයෙන් කර්මාන්ත කමිටුවට යොමු කර තිබූ බවත්, මිල ගණන්ද කැඳවා තිබූ බවත් තමන් එය නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදී. කිරිමැටියාන කොම්පෝස්ට් අංගණයට රාජ්‍යය ඇමතිතුමෙකු පැමිණියද කමිටුවේ කිසිවෙකු නොදන්නා බවත් කමිටුවේ සියළුම මන්ත්‍රීවරුන් එළදායී යෝජනා රැසක් ගෙනා බවත්,

කිසිවෙකු විසින් ඒවා වලක්වාලන බවත් මෙහි දැඩි කුමන්ත්‍රණයක් තිබෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. බල ප්‍රදේශයට ඇතුළු වන ස්ථාන වල නාම පුවරු ඉදි කිරීමට පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.
එම නාම පුවරු දැනටත් තිබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. අප සභාවේ වියදමක් නොමැතිව තොප්පුව හංදියේ එය සකස් කරන බවත් ප්‍රකාශ කරන ලදී. දංකොටුව මාළු මාකට් එක ඉංජිනේරුවරයා විසින් පරීක්ෂා කර වාර්තාවක් ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

දින කීපයකට පෙර තමන් සෙන්දිරියාමුල්ල ඉදි කිරීමට යෝජිත කොම්පෝස්ට් අංගණයේ ගොඩනැගිලි ඉදි කිරීම සම්බන්ධයෙන් වැඩ අධිකාරී මහතාගෙන් ඉල්ලූ බවත් අද වන තෙක් එය ලබා නොදුන් බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.ප්‍රසම්පාදන දැන්වීම්ද පල කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම මුදල් වෙන් කර ගැනීමට විශාල වෙහෙස මහන්සියක් ගත් බවත්, ඒ සම්බන්ධයෙන් කිසි වෙකු කතා නොකරන බවත් ගරුසභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මුදල් වෙන් කර ගත්තේනම් එම වැඩ කටයුතු නිසි ලෙස හසුරවන ලෙසද, කමිටු තිබෙන බවද කමිටු සභාපතිවරුන් සිටින බවද ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු ප්‍රකාශ කරන ලදී.

මින්පෙර ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණය පිළිබඳව සාකච්ඡා කල බවත්, එම ක්‍රීඩාංගණය සහ පිහිනුම් තටාකය වයඹ පලාතටම විශාල සම්පතක් බවත් ගරු මන්ත්‍රී කේ .නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. එම සම්පත සභාවට අයත් බවට නාමපුවරුවක් මඟින් ප්‍රදර්ශනය කිරීම සුදුසු බවටත්, එම ස්ථානයේ දර්ශනීය නාම පුවරුවක් ඉදි කිරීමට ක්‍රීඩා කමිටුවෙන්ද මින් සැහෙන කලකට පෙර තීරණයක් ගත් බවත්, නමුත් අද වන තෙක් එය ඉටු නොවී ඇති බවත් එයද නැවතත් මතක් කරන බවත් ප්‍රකාශ කරන ලදී.

පිහිනුම් තටාකය විශාල පිරිසක් භාවිතා කල බවත්, දරුවන් රැසක් පසුගිය දිනවල පැමිණි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඊලඟ මහා සභාවට පෙර ජල පිරිපහදු ඒකකයේ වැඩ කටයුතු ආරම්භ කරන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු ප්‍රකාශ කරන ලදී.

සමහර ඉංජිනේරුවරුන් මේ දින වල රාජකාරියට නොපැමිණෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

කමිටු රැස්වී ඵලදායී යෝජනා ගෙනෙනා නමුත් ඒවා ක්‍රියාත්මක නොවන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු ප්‍රකාශ කරන ලදී. කමිටු සභාපතිවරුන්ව කිසිම වැඩ කටයුත්තකට සහභාගි කර නොගන්නා බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

iv. ගරු මන්ත්‍රිනි ජේදීපා මේරි අයිරංගනි පෙරේරා මහත්මිය .කේ. ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ජනපද වල කොවිඩ්-19 වසංගතය වැඩි වී ඇති බවත්, මරණද දෙක තුනක්ම සිදු වූ බවත්, අසරණ පවුල් වලට මරණයක් සිදු වූ පසුව කරගැනීමට දෙයක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව විසින් එය සිදු කරන බවට ගරු සභාපතිතුමා පැවසුවද ඔවුන්ට රු.20,000ක මුදලක් ලබා දීමට සිදු වූ බවත් ගමේ මිනිසුන් එකතු වී එම මුදල් ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී. ජනපදවල අසරණ මිනිසුන් සිටිනා බවත් වෙන්නප්පුව සභාව සතුවද ආදහනාගාර දෙකක් තිබෙන බැවින් ඒ සඳහා යම් සහනයක් ලබාදෙන ලෙසද ඉල්ලා සිටින ලදී.

රෝහලට ආසන්නම ආදහනාගාරය වෙත මෘත දේහය රැගෙන යන බවත්, සභාවේ අදහනාගාරයේ සේවයේ නියුතු වී සිටි ප්‍රියන්ත දිසානායක මහතාගේ මරණය අවස්ථාවේද තමන් මෘත දේහය ලබාදෙන ලෙසට ඉල්ලීමක් සිදු කල බවත් නමුත් නොදුන් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී මාෆියාවක් සිදු වන බවත්, සිරිපුරට රු.20,000 මුදලක් බැඳීමට පවසන බවත්, අදහනාගාරයට වෙනම මුදලක් ගෙවිය යුතු බවත් ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කරන ලදී.

මෙය විධිමත් කල යුතු බවත්, මරණයක් සිදු වුවහොත් ග්‍රාමසේවක අඩු ආදායම්ලාභී ලෙස සහතික කරන්නේ නම් තමන් ඒ පිළිබඳව දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. අඩු ආදායම්ලාභි මරණ සම්බන්ධයෙන් සභාවට දැනුම් දීමක්ද කර තිබෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

v. ගරු මන්ත්‍රිනි අයි .එච් .නයෝමි රම්‍යලතා මහත්මිය ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව, කොට්ඨාසය තුළ රෝද පුටුවක අවශ්‍යතාවය මතු වන අවස්ථා තිබෙන බවත්, පොතුවටවන මහා විද්‍යාලයේදී ෆයිසර් එන්නත්කරණය සිදු කල අවස්ථාවේදී මෙම අවශ්‍යතාවය විශාල ලෙස මතු වූ බවත්, ගේට්ටුවෙන් ඇතුළතට වාහන ගැනීමට ඉඩ ලබා නොදුන් බවත් එහිදි තම ඇස් ඉදිරි පිට විවිධ ආබාධ තිබූ පුද්ගලයින් අපහසුතාවයට පත් වූ බවත් ප්‍රකාශ කරන ලදී. මේ සඳහා කොට්ඨාසය වෙනුවෙන් වෙන් කර තිබෙන මුදලින් හෝ නිවාස අධාර වලින් හෝ කොට්ඨාසයක් සඳහා රෝද පුටු එකක් හෝ දෙකක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී. එය කොට්ඨාසය තුළ පොදු තැනක තබා ගැනීමට හැකි බවත්, පන්සලේ හෝ තබා තැබීමට හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

තම කොට්ඨාසයේ කිහිලිකරු ජෝඩු දෙකක් තිබෙන බවත්, එම කටයුතු සිදු කරගෙන යන බවත් ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා ප්‍රකාශ කරන ලදී.

vi. මේ දින වල පවතින covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඉඩම් කට්ටි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමේදී මාස ගණන් කල් ගත වන බවත්, ඒ අනුව හෙක්ටයාර් 01 දක්වා සභා අනුමැතිය යටතේ අනුමැතිය ලබා දීම සුදුසු බවත්, ඒ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලෙසත් ගරු මන්ත්‍රී බි .ඒ.එස්. ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ගරු ආණ්ඩුකාරතුමා සමඟද මාස ගණනකින් සාකච්ඡාවක් නොතිබූ බවත්, ගරු සභාපතිවරුන් එකතු වී ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කොට තීරණයක් ගත යුතු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

vii. ගරු මන්ත්‍රී ඩිඅමල් සුරංග ම .එල්.හතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව බෝක්කු කැට කීපයක් දමා ගැනීමට ඇති බවත්, එය මේ වන තෙක් සිදු නොවූ බවත් හැකි ඉක්මනින් එය සිදු කර දෙන ලෙසද ඉල්ලා සිටින ලදී.

viii. මාර්ග සම්බන්ධයෙන් යෝජනා දෙකක් තිබෙන බවත් ඒවා කර්මාන්ත කමිටුවට යොමු කරන බවත්, කොට්ඨාස භාර මන්ත්‍රීවරුන් සමඟ සම්බන්ධ වී ඒවා සිදු කර ගන්නා ලෙසද තාක්ෂණ නිලධාරී වාර්තාව තමාට ලැබිය යුතු බවද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ix. ගරු මන්ත්‍රී එම්යන්ත පෙරේරා මහතායාල් බ්‍රිප්‍රි . ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව බොරලැස්ස නයිනමඩම පාරේ කොස්ගහවත්ත ජනපදයට අයත් රජයේ වෙල් යායට මේ වන විට කසල බැහැර කරන බවත්, ගමේ ජනතාව එය සභාවෙන් ගෙනැවිත් දමන බව පවසන බවත්, දුම්මලදෙණිය ප්‍රදේශයේද එය සිදු වූ බවත්, මෙම වැඩ කටයුත්ත නතර කර දෙන ලෙසද ඉල්ලා සිටින ලදී. සභාව භාවිතා කර එය ගොඩ කිරීමට යන බවත්, එය රජයේ ඉඩමක් බැවින් ප්‍රාදේශීය ලේකම්තුමියවද දැන්වත් කරන බවත් ප්‍රකාශ කරන ලදී.

එහි වලං නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානයක් ඉදි කිරීමට ඉඩම් කොටසක් වෙන් කර තිබෙන බවත්, දිළිඳු ගම්මාන නගා සිටුවීම සඳහා ලක්ෂ 30 මුදලක් ප්‍රතිපාදන වෙන් වී ඇති බවත්, එය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුබද්ධ ඉඩමක් බවත්, ඒ සම්බන්ධයෙන් සොයා බලන බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙය පවරා ගැනීමේ ක්‍රමවේදයක් තිබෙන බවත්, එම ක්‍රමවේදයෙන් පිට මෙම වැඩ කටයුත්ත සිදු කරනා බවත් ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

සභාවේ ට්‍රැක්ටරයක් එතැනට ගොස් නොමැති බවත්,එය වගකීමෙන් පවසන්නේදැයිද ගරු සභාපතිතුමා විමසා සිටින ලදී.

සභාවෙන් දුම්මලදෙණිය ප්‍රදේශයේ වෙලට කුණු දැමූ බවත් ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

එය දුම්ලදෙණිය නොව බණ්ඩිරිප්පුවයැයිද පාලමෙන් එහා කොටස බවත් ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

පාලමෙන් මෙහා දුම්මලදෙණිය ප්‍රදේශයේද කුණු දැමූ බවත්, බොරළු දමා පිරවීමට හැකි බවත්, නමුත් අපද්‍රව්‍යය ගෙන පුරවන බවත්, එලෙසම මෙම ප්‍රදේශයේද පටන් ගැනීමට යන බවත්, කොස්ගහවත්ත ජනපදයේ ක්‍රීඩා පිටිය ගැනීමේදී කැබිනට් අනුමැතියක් ගෙන පිරවීම ආරම්භ කල බවත් ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී. මෙය නීතයානුකූලව සිදු කරන ලෙසද පවසා සිටින ලදී.

සභාවෙන් සිදු නොකල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. ඒ සම්බන්ධයෙන් සොයා බලමුයැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තූතිය පළ කරමින් ද, සභාවේ සේවය කල ප්‍රියන්ත දිසානායක මහතාද අප අතරින් වෙන් වූ බැවින් එතුමාවද සිහි කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වා ගරු සභාපතිතුමා විසින් ප.ව 2.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.

**තීරණ අංක 01/ 2021-10-14 වන දින මහා සභා රැස්වීම**

**2021.09.09 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.**

**කේ.වී.සුසන්ත පෙරේරා,**
**සභාපති,**
**ප්‍රාදේශීය සභාව වෙන්නප්පුව**